රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 3000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

ECN/ STS 31653 – සූක්ෂම මූල්‍ය හා ග්‍රාමීය මුදල් වෙළෙඳපොළ

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
(පැහැදිලි අත්අකුරින් පිළිතුරු සපයන්න.)

කාලය : පැය 03

---

01. (i) "ග්‍රාමීය මූල්‍ය" (Rural Finance) යන සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 02)

(ii) අසංවිධිත මුදල් වෙළෙඳපොළෙහි (unorganized Money Market) ප්‍රධාන සැපයුම්කරුවන් නම් කොට සංවර්ධනය වෙමින් පවතින රටවල එම වෙළෙඳපොළෙහි ප්‍රධාන ලක්ෂණ සාරාංශගත කරන්න.

(ලකුණු 04)

(iii) විධිමත් මූල්‍ය අංශය (Formal Financial Sector) සහ අවිධිමත් මූල්‍ය අංශය (Informal Financial Sector) යන ඒවා අතර වෙනස දක්වන්න.

(ලකුණු 03)

(iv) ග්‍රාමීය ප්‍රදේශ වලට මූල්‍ය සේවා සම්පාදනයේ දී විධිමත් මූල්‍ය ආයතන කවර ආකාරයේ සංරෝධක වලට මුහුණ දෙනු ලබන්නෙහි ද?

(ලකුණු 03)

02. (i) මූල්‍ය අංශයේ සංවර්ධනය (Financial Sector Development) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? මූල්‍ය පද්ධතියක ප්‍රධාන කාර්යයන් (Main Functions) සාරාංශ ගත කරන්න.

(ලකුණු 04)

(ii) ඉල්ලුම අනුගමනය කෙරෙන උපන්‍යාසය (Demand- Following Hypothesis) සහ සැපයුම් මග පෙන්වීම් උපන්‍යාසය (Supply- leading Hypothesis) මත පදනම්ව මූල්‍ය අංශයේ සංවර්ධනය සහ ආර්ථික වර්ධනය අතර පවතින න්‍යායාත්මක බැඳීම (Theoretical linkages) සාකච්ඡා කරන්න.

(ලකුණු 08)



28

03. (i) සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය මුදල් වෙළෙඳපොළෙහි නෛසර්ගික (Inherent) දුර්වලතා හඳුනා ගන්න.

(ලකුණු 02)

(ii) ග්‍රාමීය මූල්‍ය සඳහා වන සාම්ප්‍රදායික ප්‍රවේශය (Traditional Approach to Rural Finance) සහ නව ප්‍රවේශය (New Approach) අතර වෙනස දක්වන්න.

(ලකුණු 06)

(iii) සූක්ෂම මූල්‍ය සේවා සැපයුම්කරුවන් සහ ඉලක්ක සේවා අපේක්ෂකයන් (Target Clients) නම් කර ඔවුන් පිළිබඳ කෙටි අධ්‍යයනයක් කරන්න.

(ලකුණු 04)

04. "සූක්ෂම මූල්‍ය නිර්වචනය තුළ බොහෝ විට මූල්‍ය අතරමැදිකරණය (Financial Intermediation) සහ සමාජ සජීවීකරණය (Social Mobilization) යන්න අන්තර්ගත වේ".

(i) ඉහත ප්‍රකාශය පදනම් කර ගනිමින් සූක්ෂම මූල්‍ය නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(ii) සූක්ෂම මූල්‍ය කටයුතු වල ප්‍රධාන අරමුණු (Main Objectives) ලයිස්තුගත කරන්න.

(ලකුණු 02)

(iii) සූක්ෂම මූල්‍ය පිළිබඳ අවම (Minimalist) සහ සංකලිත (Integrated) ප්‍රවේශයන් හි ප්‍රධාන අංග හඳුනා ගන්න.

(ලකුණු 04)

(iv) සූක්ෂම මූල්‍ය අංශය කවර ආකාරයේ අභියෝග වලට මුහුණ දෙනු ලබන්නේද?

(ලකුණු 03)

05. (i) 1980 ගණන් වල සිට ගෝලීය වශයෙන් සූක්ෂම මූල්‍ය පැන නැගීම සඳහා වග කියනු ලැබූ ප්‍රධාන හේතු හඳුනා ගෙන ඒවා කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(ii) සූක්ෂම මූල්‍ය කවර ආකාරයේ ක්‍රියාකාරකම් (Activities) හා සම්බන්ධ වන්නේ ද?

(ලකුණු 02)

(iii) මූල්‍ය අතරමැදිකරණ ප්‍රවේශය (Financial Intermediation Approach) සහ දරිද්‍රතාවයට ණය දීමේ ප්‍රවේශය (Poverty Lending Approach) අතර ප්‍රධාන වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

06. (i) ඒකපුද්ගල ණය දීම (Individual – Based Lending) සහ කණ්ඩායම් පදනම් ණය දීම (Group – Based Lending) අතර වෙනස කවරක් ද? ඔබගේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාව පිටුදැකීමේ දී සූක්ෂම මූල්‍යයේ කාර්යභාරය විවේචනාත්මකව විභාග කරන්න.

(ලකුණු 05)

07. "සංවර්ධන උපකරණයක් ලෙස සූක්ෂම මූල්‍ය වල ශක්‍යතාව රඳා පවතිනුයේ පහළ ආදායම් ලබන ජනගහනයෙහි විවිධ මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය කෙරෙන චිරස්ථායි සූක්ෂම මූල්‍ය ආයතන ප්‍රවර්ධනයෙහි ලා එම සේවා සපයනු ලබන අය සතුව පවතින හැකියාව මතය."

(i) දුප්පත් ව්‍යවසායකයන් සඳහා මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ණය ලබාදීමේ මූලධර්ම හතර (Four Principles) ලුහුඬින් දක්වන්න.

(ලකුණු 04)

(ii) "සූක්ෂම මූල්‍ය වාණිජකරණය" (Commercialization of Microfinance) යන පදය නිර්වචනය කරන්න.

(ලකුණු 04)

(iii) "සූක්ෂම මුල්‍ය චිරස්ථායිතාව" (Sustainability of Microfinance) යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

08. (i) ශ්‍රී ලංකාවේ විධිමත් අංශයෙහි සූක්ෂම මුල්‍ය සැපයුම්කරුවන් පහක් හඳුනා ගන්න.

(ලකුණු 03)

(ii) සූක්ෂම මුල්‍ය ආයතන තම ණය සඳහා ඉහළ පොළී අනුපාතිකයක් අයකරනු ලබන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(iii) සූක්ෂම මුල්‍ය කර්මාන්තය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී හඳුන්වා දෙන ලද නියාමන රාමුවේ වැදගත් අංග පැහැදිලි කරන්න.

(ලකුණු 06)

@@@@@@@

## UNIVERSITY OF RUHUNA

2016/2017 Academic Year B.A. (Special) Degree 3000 Level
1st Semester Examination –October / November 2017
**ECN / STS 31653 – Microfinance and Rural Money Market**
**(English Medium)**

Answer Five (05) questions only

**Time : 03 Hours**

---

01. (i) Define the concept of "Rural Finance"

(02 Marks)

(ii) List the chief suppliers in the unorganized money market and summarize the major characteristics in such markets persist in developing countries.

(04 Marks)

(iii) Distinguish between the formal financial sector and informal financial sector.

(03 Marks)

(iv) What are the constraints confronted by the formal financial institutions in providing the financial services to the rural areas.

(03 Marks)

02. (i) What do you mean by financial sector development? and summaries the main functions of a financial system.

(04 Marks)

(ii) Discuss the theoretical linkages that have been identified between financial sector development and economic growth depending on the Demand - following hypothesis Supply- leading hypothesis

(08 Marks)



30

03. (i) Identify the inherent weaknesses of rural financial markets in developing countries.

(02 Marks)

(ii) Distinguish between traditional approach to rural finance and New approach to the rural finance.

(06 Marks)

(iii) Name and study briefly the target clients and possible providers of microfinance services.

(04 Marks)

04. "The definition of microfinance often includes both financial intermediation and Social mobilization".

(i) Define the term "microfinance" using above statement.

(03 Marks)

(ii) List out the main objectives of microfinance activities.

(02 Marks)

(iii) Identify the main elements of minimalist and integrated approach to microfinance.

(04 Marks)

(iv) What kind of challenges does the microfinance sector face?

(03 Marks)

05. (i) Identify and briefly discuss the main reasons contributed to emergence of global growth of microfinance since 1980's.

(06 Marks)

(ii) What kind of activities does the microfinance involve?

(02 Marks)

(iii) Explain the main differences between the financial intermediation approach and the Poverty lending approach.

(04 Marks)

06. (i) What is the difference between the individual – based lending and the Group – Based lending? Explain your answer providing an examples of each.

(07 Marks)

(ii) Examine critically the role of microfinance in poverty alleviation process of developing countries.

(05 Marks)

07. "The viability of microfinance as a development tool will depend heavily on the ability of the stakeholders to develop sustainable microfinance institutions to meet the different financial needs of low income populations."

(i) Summarize the four principals that lead to financially viable lending to poor entrepreneurs.

(04 Marks)

(ii) Define the term 'Commercialization of microfinance'

(04 Marks)

31

(iii) Explain briefly the concept of sustainability of microfinance

(04 Marks)

08. (i) Identify five formal microfinance providers in Sri Lanka.

(03 Marks)

(ii) Explain why do microfinance institutions charge a high rate of interest for their loans.

(03 Marks)

(iii) Describe the important elements of recent regulations that have been introduced by the Sri Lanka government to regulate the microfinance industry.

(06 Marks)

@@@@@@@